**පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද ,යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතී,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල රු.1,474,427 ක් වටිනා ණයහිමියන් ගිණුම්ගත කර නොතිබුණි. | ණයහිමියන් නිවැරදිව ගිණුම්ගත කිරිමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ පැවති විදුලි භාණ්ඩ තොගය රු.132,690 ගිණුම්ගත කර තිබියදී නැවත සාවද්‍ය ලෙස රු.396,827 ක් විදුලි තොගයට හර කිරීම හේතුවෙන් විදුලි තොගය රු.529,517 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම්ගත කිරීමේදී සිදු වූ වරද ඉදිරියේදී නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළදී 2023 වර්ෂයට අදාළව ලැබී තිබූ රු.56,955 ක් වටිනා කඩකුලී ආදායම ජංගම වගකීම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ ආදායම් මාසික ප්‍රකාශයට ඇතුළත් නොවීම නිසා ගිණුම්වලින් අත්හැරී ඇති බව. | -එම- |
| (ඈ) | ළමා උද්‍යානයේ බෝට්ටු පැදීම සඳහා ඉදිකරන ලද ජල තටාක වියදම වූ රු.1,064,497 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ළමා උද්‍යානයේ බෝට්ටු පදින ජල තටාකය ඉදිකිරීමේ වටිනාකම ඉදිරියේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | ජල තටාක වියදම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළදී සිදු කිරීමට යෝජනා කර තිබූ රු.1,100,000 ක් වටිනා කර්මාන්ත 05 ක් ගිවිසුම්ගතව නොතිබුණු අතර 2022 වර්ෂයේ ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | කමිටු අනුමැතියකින් අනතුරුව මෙම කර්මාන්ත වලට අදාල වටිනාකම වන රු.1,100,000 ක මුදල ණයහිමි ලේඛනයෙන් ඉවත් කරන බව. | ගිවිසුම්ගත නොවූ කර්මාන්ත ණයහිමියන් ලෙස ගිණුම්ගත කිරීම නොකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2020 වර්ෂයේ ඉටුකරන ලද කර්මාන්ත 02 කට අදාළ රු.329,770 ක් ප්‍රාදේශීය සභාවේ ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම කර්මාන්ත දෙකට අදාල රු.329,770 ක මුදල වැරදීමකින් ණයගැතියන් ලෙස ගිණුම්ගත කර ඇති අතර එම වරද නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |
| (උ) | අරංගම ශ්‍රී බෝධිරුක්කාරාම විහාරස්ථානයට පිවිසෙන නව මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා අවසන් ගෙවීම රු.295,437 ක් වුවත් එය රු.495,143 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මින් ඉදිරියට ගෙවිය යුතු නිවැරදි මුදල ණයහිමි ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඌ) | ඉදිකිරීම් ව්‍යාපෘතියක් සඳහා ලැබිය යුතු මුදල රු.43,241 ක් සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණද, තව දුරටත් ණයගැතියන් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට ණයගැතියන් ලෙස වැරදීමකින් සටහන් වී තිබුණි. එය නිවැරදි කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඇති රු.151,160 ක් වටිනා තැන්පත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | කර්මාන්ත පරිපාලන තැන්පත් රු.151,160 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීම අතපසු වී ඇති බව. | තැන්පත් ශේෂ නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.72,242,020 ක් වූ ගිණුම් විෂයයන් 21 කට අදාල ශේෂයන් හා උපලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.18,848,707 ක වෙනසක් විය. | උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් වල පවතින වෙනස නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නිති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) (i) | මුදල් රෙගුලාසි -371 | 2022 වර්ෂය තුළ අත්තිකාරම් ලෙස අවස්ථා 56 කදී ලබාගත් අත්තිකාරම් නැවත පියවීම සඳහා දින 21 සිට 332 ක කාල ප්‍රමාදයක් ගතකර තිබුණි. | මින් ඉදිරියට අත්තිකාරම් ලබා ගැනීම හා පියවීම පිළිබඳව අධීක්ෂණය කිරිමට කටයුතු කරන බව. | යථෝක්ත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 අප්‍රේල් 22 දිනැති වයඹ පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ 18 (vi) වගන්තිය | කඩ කාමර බදු ලබාගත් පුද්ගලයින් 06 දෙනෙකු විසින් බදු මුදල් දීර්ඝකාලීනව ගෙවීම් පැහැර හැර ඇති නමුත් චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් නීත්‍යානුකූලව අයකර ගැනිමට කටයුතු කරන බව. | චක්‍රලේඛයට අනුව ක්‍රියාකළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවු වියදම රු.3,076,126 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.98,499,491 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම් රු.000 | බිල් කළ ආදායම් රු.000 | රැස්කළ ආදායම් රු.000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000 | 2021 ඇස්තමේන්තු ගත ආදායම් රු.000 | බිල් කළ ආදායම් රු.000 | රැස්කළ ආදායම් රු.000 | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු.000 |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 12,676 | 103,131 | 8,276 | 2,036 | 8,221 | 8,155 | 5,207 | 16,419 |
| කුලී | 1,.131 | 6,531 | 6,121 | 409 | 1,354 | 5,763 | 5,590 | 173 |
| බලපත්‍ර ගාස්තු | 500 | 358 | 358 | - | 500 | 323 | 323 | - |
| වෙනත් ආදායම් | 72,379 | - | 108,536 | - | 66,900 | - | 17,114 | - |
| | 86,686 | 110,020 | 123,291 | 2,445 | 76,975 | 14,241 | 28,234 | 16,592 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබූ වරිපනම් හිඟ ශේෂය රු.3,989,545ක් විය. | හිඟ වරිපනම් බදු අයකිරීමේ ජංගම වැඩසටහන් 2023 වර්ෂයේ අප්‍රේල් මස අවසන් සතියේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇති අතර ඉතා ඉක්මනින් හිඟ වරිපනම් මුදල් අඩුකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. |
| **අක්කර බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 5 ට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු අක්කර බදු හිඟය රු.83,873 ක් විය. | අක්කර බදු සඳහා සමීක්ෂණයක් සිදුකර කපා හැරීමට හැකියාව පවතින මුදල් කපා හැරීමටද, ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමටද කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| **කුලී** | | |
| (අ) පොදු වෙළඳපොළ කඩ කාමර පවත්වාගෙන ගිය පුද්ගලයින් 07 දෙනෙකුට තාවකාලිකව ලබා දී ඇති කඩ කාමර වලින් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කඩ කුලී රු.199,760 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කර ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වෘත්තීය පුහුණු අධිකාරිය පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා තක්සේරු කුලියට වඩා අඩුවෙන් කුලී අය කිරීම නිසා රු.792,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | රු.649,130 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරන බව. | දේපල බදු දීමේදී තක්සේරු වටිනාකම පදනම් කරගත යුතුය. |
| (ඇ) | වත්කම් බදු දීමට අදාළව දීර්ඝ කාලයක් තිස්සේ පැවත එන රු. 1,575,614 ක බදු මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා නෛතික පියවර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | **බලපත්‍ර ගාස්තු** | | |
| | ප්‍රාදේශීය සභා රීති 61 ප්‍රකාරව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර ලබාගන්නා ලැයිස්තුවේ ඇතුළත් කර්මාන්ත සියල්ල, කර්මාන්ත පිළිබඳ බදු ලේඛනයේ හා ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු ලේඛනයේ ඇතුළත් කළ යුතු වුවත් ගාස්තු ගෙවන ව්‍යාපාර පමණක් ලේඛනයේ ඇතුළත් කිරීමට කටයුතු කර තිබුණි. 2020 බිල්කළ ආදායම රු.1,100,000 ක් වුවද 2022 වර්ෂයේ එය රු.500,000 දක්වා අඩුවී තිබුණි. | 2023 වර්ෂයේදී ප්‍රාදේශීය සභා රීති 61 ප්‍රකාරව කටයුතු කරමින් සමීක්ෂණ කටයුතු සිදුකර ඇති බව. | වර්ෂය ආරම්භයේ විධිමත්ව සමීක්ෂණයක් සිදුකර ව්‍යාපාර බදු හා බලපත්‍ර ගාස්තු අයකරගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අරමුණුවලින් බැහැර ක්‍රියාකරකම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භෞතික සැලසුම් මංමාවත් හා ඉඩම් ගොඩනැගිලි අළුත්වැඩියාව හා නඩත්තු කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 46 ක් ඇස්තමේන්තු කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ රු.6,953,617 ක් වටිනා කර්මාන්ත 18 ක් වර්ෂය තුළ ඉටුකර තිබුණි. | 2023 වර්ෂය තුළදී ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරන බව. | ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් හා ඉලක්ක පූර්ණය කිරීමට ක්‍රියා කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොඩවෙල සති පොළ ආපනශාලාව 1996 වර්ෂයේ සිට ගිවිසුමකට එළඹ කුලී පදනම යටතේ එක් පුද්ගලයෙකු විසින් පවත්වාගෙන ගොස් තිබූ අතර වරින්වර බදු කාලය දීර්ඝ කරමින් 2021 අගෝස්තු 30 ට බදු ගිවිසුම් කාලය අවසන් වී තිබූ අතර බදු දේපලක බදු කාලය අවසන් වූ විට එම දේපල ටෙන්ඩර් කර නැවත බදුදීමට කටයුතු කළ යුතු වුවද ඊට පටහැනිව 2021 මැයි 04 දිනැති මුදල් කමිටු | ගොඩවෙල සති පොළ ආපනශාලාව සඳහා 2021 අගෝස්තු 31 දින සිට වසර 03 ක් සඳහා ගිවිසුම් අත්සන් කර ඇති බව. | විධිමත් අයුරින් බදු දීමට ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තීරණය මත ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතියට යටත්ව 2021 අගෝස්තු 31 දින සිට ඉදිරියට තවත් වසර 03 ක කාලයක් සඳහා ඉහතින් දැක්වූ පුද්ගලයාටම ලබා දී තිබූ අතර විගණන දිනය වූ 2023 ජනවාරි 30 දින වන විටත් ඇප මුදල් වන රු.80,000 හා මුද්දර ගාස්තු රු.2,400 ක මුදල අයකර ගිවිසුම් ගත වීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | උහුමීය බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම් නිමකර 2021 දෙසැම්බර් 24 දිනට සභාව වෙත භාර නොදීම හේතුවෙන් බදු ලබා දී සභාවට අයකරගත හැකිව තිබූ රු.1,040,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | ගොඩනැගිල්ල සඳහා විදුලිය ලබා ගැනීමට විදුලි බල මණ්ඩලය සතුව අවශ්‍ය උපකරණ නොමැති වීම හේතුවෙන් නියමිත පරිදි කඩ බදු දීමට නොහැකි වූ බව. | සභාවට ආදායම් උපයාගත හැකි මාර්ගයක් බැවින් කඩිනමින් වැඩ නිමකර බදු දීමට ක්‍රියා කළ යුතුය. |
| (ඇ) | රු.19,244,563ක වියදම් දරා පොල්ගහවෙල උහුමීය බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකර ඇති ඉඩම කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය සතු ඉඩමක් වන අතර 2023 ජනවාරි 30 වන විටත් එම ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම නීත්‍යානුකූල ලෙස පවරා දෙන ලෙස වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් පළාත් පාලන කොමසාරිස්තුමාගේ එකඟතාවය ලද වහාම පවරා ගැනීමට කටයුතු කරන බව. | ඉඩම කඩිනමින් අත්පත් කර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | වරිපනම් තක්සේරුව වර්ෂ 05 කට වරක්වත් සිදුකළ යුතු වුවත් පොල්ගහවෙල සභාවේ අවසන් වරට වරිපනම් තක්සේරුව සිදුකර තිබුණේ 2014 වර්ෂයේදීය. | 2020 වර්ෂයේ දී වරිපනම් තක්සේරුවක් සිදු කර ඇතිමුත් මේ වන තුරු එම නව තක්සේරුව නොලැබීම හේතුවෙන් 2014 වර්ෂයේ වරිපනම් තක්සේරුව මත පදනම්ව 2022 වර්ෂයේ වරිපනම් බදු අය කිරීම සිදු කෙරිණි. | නියමිත දිනට වරිපනම් තක්සේරු කරවා ගත යුතුය. |
| (ඉ) | 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නිකුත් කර තිබූ අනුකූලතා සහතික 112 ක තක්සේරුවක් ලබාගෙන වරිපනම් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම අනුකූලතා සහතික 112 ට අදාළ ඒකකයන්හි තක්සේරුව ලබාගෙන වරිපනම් අය කිරීමට කටයුතු නොකිරීම අපගේ අතපසුවීමක් බව. | අදාළ දේපල තක්සේරු කර වරිපනම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සභාව සතු පොල්ගහවෙල කැගල්ල පාරේ පිහිටි ගවඝාතකාගාරය පිහිටි ඉඩමේ තේ කඩයක් පවත්වාගෙන යාමට බාහිර පාර්ශවයකට දීර්ඝකාලීනව බදු දීමේදී ඒ සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එලෙස අනුමැතියකින් තොරව තාවකාලිකව තේ | මෙම කඩය දීර්ඝ කාලීනව බදු දී නොමැති අතර වසර 2 ක් සඳහා 2015 මැයි 11 කමිටු නිර්දේශයෙන් හා මහා සභා අනුමැතිය මත | විධිමත් අයුරින් බදු දීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කඩයක් සහ පළතුරු කඩයක් ඉදිකරගෙන පවත්වාගෙන යාම සඳහා 2015 මැයි 11 දිනැති කමිටු තීරණය මත ලබා දී තිබුණු අතර 2017 මැයි 11 දිනෙන් පසුව මෙම ගිවිසුම අවලංගු වුවද 2022 මැයි 01 දින දක්වාම විධිමත් ගිවිසුමකින් තොරව තේ කඩය පවත්වාගෙන යාමට සභාව විසින් ඉඩ හැර තිබුණි. | වසර 2 කට ගිවිසුම් ගත වී ඇති අතර වසර 2න් 2 ට මෙම ගිවිසුම අලුත් කර ඇති බව. | |

## 04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී වර්ෂය තුළ ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්ට අදාළව සත්‍ය ක්‍රියාකාරකම් හඳුනාගෙන පිරිවැය ඇස්තමේන්තු සකස් කර ඒ අනුව සැලසුම් සකස් නොකර නාමමාත්‍රික (Dummy) ක්‍රියාකාරකම් සඳහා ප්‍රතිපාදන තක්සේරු කර ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණි. | 2023 වර්ෂය තුළදී ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කරන බව. | ක්‍රියාකාරී සැලැස්මට අනුගතව සභාවේ කටයුතු මෙහෙයවීමට ක්‍රියා කළ යුතුය. |